# නීතිවේදි උපාධි පාඨමාලාව

## ශිෂ්‍ය අත්පොත

## 2016/2017 අධ්‍යයන වර්ෂය




## නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
# නීතිවේදී උපාධි පාඨමාලාව
# 2016/2017 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධි පාඨමාලාවට අපි ඔබ සාදරයෙන් පිළිගනිමු.

නීතිවේදී උපාධි පාඨමාලාවට ඇතුළත් වීම සඳහා ඔබ ගත් තීරණය පිළිබඳව අපි සතුටු වෙමු. ඔබගේ අධ්‍යයන උත්සාහය ජයග්‍රහණය කිරීම සඳහා සුභ පතන අතර විශ්වවිද්‍යාල අධ්‍යයන කාලය තුළ දී ඔබගේ අධ්‍යයන ඉලක්ක සඵල කර ගැනීම උදෙසා අපි ඔබට සහය වන්නෙමු.

මෙම අත්පොත මගින් විවෘත විශ්වවිද්‍යාලය පිළිබඳ මූලික තොරතුරු සහ නීතිවේදී උපාධි වැඩසටහන පිළිබඳ විස්තර ඔබට ඉදිරිපත් කරයි. එය කොටස් දෙකකින් සමන්විත වේ. පළමු කොටසින් විවෘත විශ්වවිද්‍යාලය පිළිබඳව සාමාන්‍ය තොරතුරු, එහි ඉගැන්වීමේ හා ඉගෙන ගැනීමේ ක්‍රමවේදයන් හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන පද්ධතිය පිළිබඳ කරුණු දක්වා ඇත. දෙවන කොටසින් නීතිවේදී උපාධි වැඩසටහන සහ එහි අධ්‍යයන කටයුතු පිළිබඳ විශේෂ තොරතුරු ඉදිරිපත් කරයි.

නීතිවේදී උපාධි වැඩසටහන පිළිබඳ නවතම තොරතුරු ඉදිරිපත් කිරීමට අපි සෑම ප්‍රයත්නයක්ම ගන්නා අතර මෙහි දී ඇති තොරතුරු 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා විවෘත විශ්වවිද්‍යාලය පිරිනමන ලද වැඩසටහනට පමණක් අදාල වේ. විවෘත විශ්වවිද්‍යාලයේ රෙගුලාසි හෝ සමස්ත ප්‍රතිපත්තියේ පසුකාලීනව සිදුවන වෙනස්කම් මගින් මෙහි දක්වා ඇති තොරතුරු අදාල නොවන අවස්ථා ඇති විය හැකි ය. එවැනි අවස්ථාවල දී එකී නව වෙනස්කම් පිළිබඳව ඔබව දැනුවත් කරනු ඇත.

මාගේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සමග මම නැවත වරක් ඔබගේ අධ්‍යයන කටයුතු සාර්ථක වේවා යි පතමි.

**රෝහණ රත්නායක**
**අංශාධිපති,**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව.**

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
# නීතිවේදී උපාධි වැඩසටහන
# 2016/2017 අධ්‍යයන වර්ෂය

## I කොටස - සාමාන්‍යය තොරතුරු

### 1. විශ්වවිද්‍යාලය

විවෘත විශ්වවිද්‍යාලය යනු ශාස්ත්‍රිය වශයෙන් ස්වයංපාලනයක් සහිත ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයකි. එහි භාවිත කරන විවෘත හා දුරස්ථ අධ්‍යයන ක්‍රමවේද යටතේ වයස අවුරුදු 18 ට වැඩි ඕනෑම පුද්ගලයෙකුට සහතික පත්‍රයක්, ඩිප්ලෝමාවක්, ප්‍රථම උපාධියක්, පශ්චද් උපාධියක් හෝ වෙනත් අධ්‍යාපනික සුදුසුකමක් ලබාගත හැකි පාඨමාලාවක් හැදෑරීමට හැකි ය.

විවෘත විශ්වවිද්‍යාලය, එයට ඇතුලත් වන සිසුන්ගේ දෘෂ්ටි කෝණයෙන් බලන විට නිවසෙහි සිට අධ්‍යාපනය ලබා ගන්නා විශ්වවිද්‍යාලයක් ලෙස සලකයි. එමගින් උසස් අධ්‍යාපනය ලබාගැනීමේ අවස්ථා අහිමි වූ අයට ඔවුන්ගේ ජීවිතයේ පසු කාලයක දී එම අවස්ථාව උදා කර ගත හැකි ය.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත සහ 1990 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය නියමාවලිය යටතේ පිහිටුවන ලද විවෘත විශ්වවිද්‍යාලයට ශ්‍රී ලංකාවේ වෙනත් ජාතික විශ්වවිද්‍යාලයකට හිමි නෛතික හා ශාස්ත්‍රිය තත්ත්වය ම ඇත. ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම සම්ප්‍රදායික විශ්වවිද්‍යාලයක මෙන් විවෘත විශ්වවිද්‍යාලයේ ද විධායක බලාධිකාරිය සහිත පාලක සභාව මෙන්ම ශාස්ත්‍රිය තීරණ ගැනීම සඳහා සනාතන සභාව ද සමන්විත වේ. උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිළධාරියා වේ. විවෘත විශ්වවිද්‍යාලයට ම ආවේණික වූ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයක් මෙන් ම මධ්‍යම මණ්ඩපයක් ද ප්‍රාදේශීය හා දිස්ත්‍රික් අධ්‍යයන මධ්‍යස්ථාන ජාලයක් ද ඇත.

විවෘත විශ්වවිද්‍යාලය සතුව පීඨ පහක් ඇත. ඒවා නම් **මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, අධ්‍යාපන පීඨය, ඉංජිනේරු තාක්ෂණ පීඨය ස්වභාවික විද්‍යා පීඨය හා සෞඛ්‍ය විද්‍යා පීඨය** වේ. මෙම පීඨ මගින් සහතික පත්‍ර පාඨමාලාවල සිට ආචාර්ය උපාධි වැනි පශ්චාද් උපාධි දක්වා වූ විවිධ අධ්‍යයන වැඩසටහන් පවත්වනු ලැබේ. පීඨයේ ප්‍රධාන අධ්‍යයන හා පරිපාලන නිළධාරියා පීඨාධිපතිවරයා ය. එක් එක් පීඨය යටතේ කිසියම් විශේෂිත විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් කටයුතු කරන අධ්‍යයනාංශ ඇත. එක් එක් අධ්‍යයනාංශයට එම අධ්‍යයනාංශයේ පරිපාලන හා අධ්‍යයන ක්‍රියාකාරකම් පිළිබඳව වගකීම දරන අංශ ප්‍රධානියෙකු සිටී.

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය යටතේ ඇති නීති අධ්‍යයන අංශය මගින් නීතිවේදී උපාධි වැඩසටහන (LL.B) සහ නීතිය පිළිබඳ පශ්චාද් උපාධිය (LL.M) වැඩසටහන මෙහෙයවයි.

## 2. පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන්

විවෘත විශ්වවිද්‍යාලය වෙනත් සම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලින් වෙනස් වෙයි. එනිසා එහි එදිනෙදා ක්‍රියාකාරකම්වල දී භාවිත කරනු ලබන සුවිශේෂී වදන් මාලාව පිළිබඳව ඔබ දැනුවත්වීම වැදගත් වේ.

නිදසුන් ලෙස **පාඨමාලාවක්** යනුවෙන් අදහස් වන්නේ එක් අධ්‍යයන වර්ෂයක් තුළ දී සම්පූර්ණ කළ හැකි මූලික අධ්‍යයන ඒකකයකි. අධ්‍යයන වැඩසටහනකට පාඨමාලා කිහිපයක් තිබිය හැකි ය. නීතිවේදී උපාධි වැඩසටහන යටතේ එහි සිව් වසරක අධ්‍යයන කාලය තුළ පාඨමාලා 16 ක් සිසුන්ට හැදෑරිය හැකි ය.

කිසියම් අධ්‍යයන වැඩසටහනක් මගින් ඉදිරිපත් කරනු ලබන පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව සහතිකයක්, ඩිප්ලෝමාවක්, උපාධියක් හෝ පශ්චාද් උපාධියක් ලබා ගත හැකි ය. මෙම සුදුසුකම් පහත දක්වා ඇති අධ්‍යයන වැඩසටහන් මගින් ලබා ගත හැකි ය.

1. පදනම් වැඩසටහන
2. සහතිකපත් වැඩසටහන
3. ඩිප්ලෝමා වැඩසටහන
4. ප්‍රථම උපාධි වැඩසටහන
5. පශ්චාද් උපාධි වැඩසටහන
6. අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන

පදනම් වැඩසටහන සෙසු අධ්‍යයන වැඩසටහන්වලට ඇතුළුවීමේ දොරටුව වන අතර මූලික අධ්‍යයන ක්ෂේත්‍ර පිළබඳව පළමුවන සහ දෙවන මට්ටම් යටතේ අධ්‍යයන හැදෑරිය හැකි ය. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පමණක් සමත්ව අ.පො.ස. (උසස් පෙළ) විභාගය අසමත් වූ ශිෂ්‍යයෙකු ට විවෘත විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවනු ලබන ඕනෑම පාඨමාලාවක ට අයදුම් කිරීම සඳහා අවශ්‍ය වන අවම සුදුසුකම සමඟින් ලබා ගත හැකි ය.

එසේම අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙර විධිමත් අධ්‍යාපන ක්‍රමයෙන් ගිලිහී උසස් අධ්‍යාපනයක් ලැබීමේ අපේක්ෂාවන් අත්හැර දමා ඇති ශිෂ්‍යයෙකුට පදනම් මට්ටමේ සිට අධ්‍යයන කටයුතු නැවත ආරම්භකර නීතිය වැනි විෂය ක්ෂේත්‍රයක් අධ්‍යයනය කිරීමේ අවස්ථාව ද උදා කර ගත හැකි ය[1]. කෙසේ වුව ද පදනම් වැඩසටහනක් සාර්ථක ලෙස නිම කරන ශිෂ්‍යයෙකු නීතිවේදී උපාධි වැඩසටහන සඳහා තෝරා ගනු ලබන්නේ ඔහු හෝ ඇය විසින් ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිට එයින් සාර්ථක වුවහොත් පමණි.

[1] නීති අධ්‍යයන දෙපාර්තමේන්තු පදනම් පාඨමාලා නොපවත්වයි. එහෙත් සමාජ විද්‍යා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් එම පාඨමාලා පවත්වයි.

## 3. අධ්‍යයන ක්‍රමය

**මුද්‍රිත පාඨමාලා ග්‍රන්ථ** - විවෘත විශ්වවිද්‍යාලය අනුගමනය කරන විවෘත හා දුරස්ථ අධ්‍යයන ක්‍රමය යටතේ මුද්‍රිත පාඨමාලා ග්‍රන්ථ වැදගත් කාර්යක් ඉටු කරයි. කිසියම් අධ්‍යයන වැඩසටහනකට ලියාපදිංචි වන ශිෂ්‍යයන්ට ලියාපදිංචි වන අවස්ථාවේ දී සහ පසු අවස්ථාවල දී මුද්‍රිත පාඨමාලා ග්‍රන්ථ ලබා දෙනු ලබයි. ශිෂ්‍යයින්ට ඒවා අධ්‍යයනය කර ප්‍රාදේශිය හා අධ්‍යයන මධ්‍යස්ථානවල පවත්වනු ලබන **දින පාසල්වලට** සහභාගි විය හැකි ය. මෙම දින පාසල් මගින් විෂයානුබද්ධ කරුණු පිළිබඳව කථිකාචාර්යවරුන් සමඟ සාකච්ඡා කිරීමෙන් වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට සිසුන්ට හැකි වේ.

**ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යයන උපකරණ** - දින පාසල්වලට අතිරේකව විවෘත හා දුරස්ථ අධ්‍යයන ක්‍රමවේද යටතේ මෙම ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යයන උපකාරක ද යොදා ගනු ලැබේ. මේවාට වීඩියෝ චිත්‍රපට, ශ්‍රව්‍ය-ශ්‍රවණ පට හා පවර් පොයින්ට් මගින් කරනු ලබන කරුණු ඉදිරිපත් කිරීම් ද ඇතුළත් වේ.

**දින පාසල්**[2] **-** ප්‍රාදේශිය හා දිස්ත්‍රික් අධ්‍යයන මධ්‍යස්ථානවල පවත්වනු ලබන දින පාසල් (සතිඅන්ත) මගින් ගුරුවරයා සහ සිසුන් අභිමුඛව සිට (face to face) අධ්‍යයනය කිරීමේ සීමිත අවස්ථාවන් සිසුන්ට ලබා ගත හැකි ය. විශ්වවිද්‍යාලය මගින් පත් කරනු ලබන දින පාසල් ආචාර්යවරු මෙම අධ්‍යයන වාර පවත්වති.

නීතිවේදී උපාධි වැඩසටහන යටතේ ඇති සෑම පාඨමාලාවක් සඳහාම අවම වශයෙන් පැය 20 ක දින පාසල් අදාළ අධ්‍යයන වර්ෂය තුළ පැවැත්වේ. මෙම දින පාසැල්වලට අතිරේකව විශේෂ සම්මන්ත්‍රණ ද මෙම මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ.

**අන්තර්ජාල (Online) පාඨමාලා**

සමහර පීඨවල ඇති පහසුකම් හා විශේෂඥතාවය මත අන්තර්ජාල පාඨමාලා ඉදිරිපත් කරයි. කිසියම් පාඨමාලාක් සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයින්ට එම පාඨමාලාව යටතේ අන්තර්ජාලය මගින් ලබා දෙන පාඨමාලා සඳහා ද ලියාපදිංචි විය හැකි ය.

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව දැනට පාඨමාලා 12 කිහිපයක් අන්තර්ජාලය මගින් (moodle) ඉදිරිපත් කර ඇත. එහෙත් නීතිවේදී උපාධි වැඩසටහන යටතේ ඉදිරිපත් කර ඇති මෙම පාඨමාලාවලින් එම පාඨමාලාවට අදාල නඩු තීන්දු, පනත්, පර්යේෂණ ලිපි සහ පසුගිය ප්‍රශ්න පත්‍ර පමණක් සිසුන්ට ලබා ගත හැකි ය. මෙම පහසුකම ලබා ගැනීම සඳහා සිසුන් අන්තර්ජාලය[3] වෙත ප්‍රවේශ විය යුතුය.

---

[2] දින පාසලක් යනු කථිකාචාර්යවරයා සහ සිසුන් අභිමුඛව පවත්වනු ලබන ඉගෙනගැනීමේ හා ඉගැන්වීමේ ක්‍රමවේදයකි.

[3] OUSL වෙබ් පිටු - http://ousl.nodes.lk

## 4. පැවරුම් සහ විභාග

අධ්‍යයන පාඨමාලාව මුළුල්ලේම සිසුන්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක්කරනු ඇත. අධ්‍යයන වර්ෂය මුළුල්ලේම සිසුන් පරීක්‍ෂණවලට පෙනී සිටීම සහ පැවරුම්වලට පිළිතුරු ලබාදීම ට සිදු වේ. එකී පැවරුම් සඳහා දෙන ලද පිළිතුරු ඇගයීම් කර ලකුණු සමඟ පිළිතුරු පරීක්‍ෂකගේ ලිඛිත අදහස් ද සමඟ නැවත ලබා දේ.

මෙම කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමය "අඛණ්ඩ ඇගයීමේ ක්‍රමය Continuous Assesment System (CAS)" ලෙස හඳුන්වයි. එකී අඛණ්ඩ ඇගයීම්වල ස්වරූපය, ව්‍යුහය හා සංඛ්‍යාව අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලබන අතර එය අධ්‍යයන වර්ෂය හා පාඨමාලාව අනුව වෙනස් වේ. නිදසුන් ලෙස ඒවා සංවෘත ග්‍රන්ථ පරීක්‍ෂණ - Closed Book Test (CBT), විවෘත ග්‍රන්ථ පරීක්‍ෂණ - Open Book Test (OBT), නිවසේ දී කරන පැවරුම් - Tutor Marked Assignment (TMA), වාචික පරීක්‍ෂණ (Viva Vorce/Oral Presentation) හෝ ව්‍යාපෘති වාර්තා (Project Report) විය හැකි ය.

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් දෙනු ලබන උපදෙස් පත්‍රිකා සිසුන් කියවිය යුතු අතර අඛණ්ඩව අධ්‍යයනය කිරීම හා අඛණ්ඩව කාර්ය සාධනය ඇගයීමේ වැදගත්කම පිළිබඳව ඔවුන් අවබෝධ කරගත යුතු ය. මෙම අධ්‍යයන දෙපාර්තමේන්තුව, වර්ෂ අවසානයේ පවත්වන අවසාන විභාගයට පමණක් පෙනී සිටීමට සිසුන් දිරි නොගන්වයි. වර්ෂය මුළුල්ලේම පවත්වන අඛණ්ඩ ඇගයීම් පරීක්‍ෂණ සඳහා සිසුන් පෙනී සිටිය යුතු අතර එම පරීක්‍ෂණවලින් ලබා ගන්නා ලකුණු වර්ෂය අවසානයේ පවත්වනු ලබන අවසාන විභාගයේ ලකුණුවලට එකතු කරනු ලැබේ.

සෑම පාඨමාලාවක් අවසානයේදී ම අවසාන විභාගයක් පැවැත් වේ. අවසාන ශ්‍රේණිය (Grade) තීරණය වන්නේ පැවරුම් සහ වර්ෂය අවසානයේ පවත්වන විභාගවල සමස්ත ප්‍රතිඵලය අනුව ය.

ඒ අනුව අඛණ්ඩ ඇගයීම් වලින් 30% ක ලකුණු ප්‍රමාණයක් සහ වසර අවසන් විභාග සඳහා 70% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත හැකි ය. විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ක්‍රමය තුළ අඛණ්ඩ ඇගැයීම් වැදගත් අංගයක් වන බැවින් පාඨමාලාවක් සාර්ථක ලෙස නිම කිරීම සඳහා අඛණ්ඩ ඇගැයීම්වල දි ලකුණු ලබා ගැනීම අත්‍යවශ්‍ය බව අවධාරණය කළ යුතු ය.

## 5. ප්‍රාදේශිය මධ්‍යස්ථාන සහ අධ්‍යයන මධ්‍යස්ථාන

දැනට විවෘත විශ්වවිද්‍යාලය ප්‍රාදේශිය මධ්‍යස්ථානය අටක්, කොළඹ, මහනුවර, මාතර, යාපනය, මඩකලපුව, අනුරාධපුර, බදුල්ල හා කුරුණෑගල යන නගරවල පිහිටුවා ඇත. මෙම මධ්‍යස්ථානවලින් එක් මධ්‍යස්ථානයක් නීතිවේදි උපාධි වැඩසටහන හැදෑරීම සඳහා තෝරාගෙන ඇති ශිෂ්‍යයන් එම මධ්‍යස්ථානයේ පමණක් දින පාසල්වලට, අඛණ්ඩ ඇගැයීම් පරීක්ෂණ හා අවසාන විභාගවලට පෙනී සිටිය යුතු ය.

සිසුන්ට පහසුකම් සැලසීම සඳහා විවෘත විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන මධ්‍යස්ථාන ජාලයක් රට පුරා පිහිටුවමින් පවතින අතර දැනට අධ්‍යයන මධ්‍යස්ථාන 19 ක් පිහිටුවා ඇත.

## 6. පුස්තකාල පහසුකම්

විවෘත විශ්වවිද්‍යාලයීය මධ්‍යම මණ්ඩපයේ සහ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල පිහිටුවා ඇති පුස්තකාල මගින් විමර්ශන සේවා සපයනු ලැබේ. මෙම පුස්තකාලවල කාර්ය මණ්ඩල විසින් ඔබට අවශ්‍ය පොත්පත් පිළිබඳ තොරතුරු සපයනු ඇත. පුස්තකාල පහසුකම් භාවිත කරමින් නිර්දේශිත නීති වාර්තා, ව්‍යවස්ථා හා නීති රචකයින් විසින් රචිත ග්‍රන්ථ කියවීම නීතිවේදී උපාධි වැඩසටහනේ වැදගත් අංගයක් වන හෙයින් එම ග්‍රන්ථ කියවන ලෙස සිසුන්ට උපදෙස් දෙනු ලැබේ.

## 7. ගාස්තු හා වෙනත් පිරිවැය

විවෘත විශ්වවිද්‍යාලය ගාස්තු අය කරන දුරස්ථ අධ්‍යාපන ආයතනයක් වන හෙයින් ලියාපදිංචි සිසුන් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා ගාස්තු ගෙවිය යුතු වේ. මුද්‍රිත පාඨමාලා ග්‍රන්ථ, ශ්‍රව්‍ය-දෘශ්‍ය පාඨමාලා ද්‍රව්‍ය පිළියෙල කිරීම, විශ්වවිද්‍යාලය පත්කර ඇති බාහිර දින පාසල් කථිකාචාර්යවරුන්ට හා විභාග පරීක්ෂකවරුන්ට ගෙවීම් කිරීම, අඛණ්ඩ ඇගැයීම් හා අවසාන පරීක්ෂණ පැවැත්වීම යනාදිය සඳහා වැය වන පිරිවැය පියවා ගැනීම පිණිස සිසුන්ගෙන් මෙම ගාස්තු අය කර ගනු ලැබේ.

කිසියම් අධ්‍යයන වැඩසටහනක් සඳහා විවෘත විශ්වවිද්‍යාලයට තෝරාගෙන ඇති අයදුම්කරුවෙකුට ලියාපදිංචි වීම හා පාඨමාලා ගාස්තු සඳහා වවුචර් පත්‍රයක් එවනු ලැබේ. එම අධ්‍යයන වැඩසටහනට ලියාපදිංචි වීම සඳහා පැමිණීමට පෙර අදාල ගාස්තු ගෙවිය යුතු වේ. එලෙස ගෙවිය යුතු ගාස්තු මොනවාදැයි යන්න අදාල වවුචරයේ දක්වා ඇත. පාඨමාලා ගාස්තු වාරික දෙකකින් ගෙවිය යුතු අතර පළමු වාරිකය ලියාපදිංචි වීමට පෙර ගෙවිය යුතු ය.

**මෙම ගාස්තුව සමස්ත වියදමින් 1/3 ක් පමණක් වන අතර ඉතිරි 2/3 ශ්‍රී ලංකා රජය විසින් දරණු ලැබේ.**

## II කොටස - නීතිවේදී උපාධි වැඩසටහන

## 8. හැඳින්වීම

විවෘත විශ්වවිද්‍යාලයේ නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් 1984 වර්ෂයේ සිට නීතිවේදී උපාධි පාඨමාලාව මෙහෙයවයි. විවෘත හා දුරස්ථ අධ්‍යාපන ක්‍රමය උපයෝගී කරගනිමින් නීතිවේදී උපාධි වැඩසටහනක් ශ්‍රී ලංකාව තුළ ඉදිරිපත් කරන එකම විශ්වවිද්‍යාලය වන්නේ විවෘත විශ්වවිද්‍යාලය යි.

මෙම පාඨමාලාව නිර්මාණය කිරීම සඳහා නීති අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අරමුණු සහ ඉලක්ක වූයේ,

- විවෘත හා දුරස්ථ අධ්‍යාපන පරිසරය තුළ නීතියේ ප්‍රධාන විෂයයන් පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා ශිෂ්‍යයන්ට මඟ පෙන්වීම හා උපකාර කිරීම.

- බුද්ධිමය විමර්ශනය, විශ්ලේෂණය හා විවේචනාත්මක චින්තනය පිළිබඳ නිපුණතා වර්ධනය කිරීම.

- ප්‍රායෝගිකව නීතිය ක්‍රියාත්මක වන ආකාරය සහ සමකාලීන සමාජය තුළ නීතියෙහි කාර්යභාරය පිළිබඳව අවබෝධයක් ලබා දීම.

- වර්තමාන ගැටළුවලට අදාළ සංකීර්ණ කරුණු විශ්ලේෂණය කිරීමේ කුසලතාවය සහ සමකාලීන යථාර්ථයන්ට නීතිය අදාල කිරීම පිළිබඳව නිපුණතාවයන් වර්ධනය කිරීම.

- උපදේශනාත්මක හා ඉදිරිපත් කිරීමේ කුසලතාව හා ලිවීමේ හැකියාව වර්ධනය කර ගැනීම සඳහා සිසුන්ට සහය වීම.

- නෛතික පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය නිපුණතා වර්ධනය සහ නීතිය පිළිබඳව බහු-විෂයානුබද්ධ ප්‍රවේශයන් වර්ධනය කිරීම.

## 9. ඇතුළත්වීමේ සුදුසුකම්

9.1 2016/2017 අධ්‍යයන වර්ෂයේ නීතිවේදී උපාධි පාඨමාලාව සඳහා විවෘත විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වීමට/බඳවා ගැනීමට අයදුම් කිරීම සඳහා යෝග්‍යතාවය ලබා ගැනීමට අයදුම්කරුවකු විසින් **පහත සඳහන් සුදුසුකම් අතරින් කිසිවක් ලියාපදිංචිය හෝ බඳවා ගැනීමේ අවස්ථාව වන විට සපුරා තිබිය යුතු ය.**

(අ) විවෘත විශ්වවිද්‍යාලයේ ඕනෑම පදනම් පාඨමාලාවක 1 වන සහ 2 වන මට්ටම සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම: හෝ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ (විෂයයන් 4 ක් සහිත පැරණි නිර්දේශය) **විෂයයන් 4** ක් සමත්ව තිබීම, හෝ අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 3 ක් වත් සමත් වී අනෙක් විෂයය පසු වතාවක දී සමත් වී තිබීම: හෝ

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ (නව නිර්දේශය යටතේ) ප්‍රධාන විෂයයන් 3 ක් එකවර සමත්ව තිබීම: හෝ

(ඈ) විවෘත විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලැබිය හැකි සමාන හෝ ඉහළ සුදුසුකමක් ලබා තිබීම: හෝ

(ඉ) නීතිඥයෙකු වීම.

9.2 නීතිඥයන් හැර ඉහත සුදුසුකම් කිසිවක් ලබා සිටින අපේක්‍ෂකයන් නීතිවේදී උපාධි වැඩසටහනට ඇතුළත් වීම සඳහා ප්‍රවේශ පරීක්‍ෂණයකට පෙනී සිට විශ්වවිද්‍යාලය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන අවම කඩඉම් ලකුණු ප්‍රමාණය ලබා ගත යුතු ය.

9.3 නීතිඥවරු ලෙස අයදුම්කරන අයදුම්කරුවන් ප්‍රවේශ පරීක්‍ෂණයට පෙනී සිටීම අවශ්‍ය නොවන අතර ඔවුන් 3 වන මට්ටමේ පාඨමාලාවලින් ද නිදහස් කරනු ලැබේ. ඒ අනුව ඔවුන්ට 4 වන මට්ටමේ පාඨමාලා සඳහා සෘජුවම ලියාපදිංචි වීමට හැකියාව ඇත. කෙසේ වුවද, එවැනි අයදුම්කරුවන්ද උපාධි වැඩසටහනේ අනෙකුත් සියළු නීති රීතිවලට යටත් වේ.

9.4 විදේශීය විශ්වවිද්‍යාල වලින් ලබා ගන්නා ලද නීතිවේදී උපාධිය සහිත අයදුම්කරුවන්ගේ එම විදේශීය සුදුසුකම් විවෘත විශ්වවිද්‍යාලය විසින් පිළිගනු ලබන්නේ නම් පමණක් එකී අයදුම්කරුවන් ප්‍රවේශ විභාගයෙන් නිදහස් වනු ඇත.

9.5 අපේක්ෂකයෙකු විසින් තමන් අධ්‍යයන කටයුතු කරගෙන යාමට අපේක්ෂා කරන ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දී පමණක් ප්‍රවේශ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු ය.

9.6 නීතිවේදී උපාධි වැඩසටහන සඳහා සිසුන් තෝරා ගැනීමේ ප්‍රවේශ පරීක්ෂණය **2017 මාර්තු මස 05** වන දින පැවැත්වීමට නියමිත ය.

9.7 පෙර පරිදිම මෙම වර්ෂයේදීත් නීතිවේදී ප්‍රවේශ විභාගය පහත සඳහන් ආකාරයට ප්‍රශ්න පත්‍ර හතරකින් සමන්විත වේ. සමස්ත විභාගය සඳහා වෙන්කර ඇති කාලය පැය තුනකි.
කෙසේ වුව ද විභාගයේ ආකෘතිය පහත දක්වා ඇති ආකාරයට වෙනස් වේ.

| විභාගයේ ආකෘතිය | | | | |
|---|---|---|---|---|
| | **ප්‍රශ්න පත්‍රයේ නම** | **ලබාදෙන ලකුණු** | **ප්‍රශ්න පත්‍රය සඳහා ගතකළ යුතු කාලය** | **ප්‍රශ්න පත්‍රය සඳහා ලබාදෙන බර (ඇතුළත්වීම සඳහා සුදුස්සෙක් වීමට ලබාගත යුතු අවම ලකුණු)** |
| ප්‍රශ්න පත්‍රය I | සාමාන්‍ය බුද්ධිය | 100 | විනාඩි 60 | අවම ලකුණක් නොමැත |
| ප්‍රශ්න පත්‍රය II | සාමාන්‍ය දැනීම | 100 | විනාඩි 40 | අවම ලකුණක් නොමැත |
| ප්‍රශ්න පත්‍රය III | සිංහල/දෙමළ භාෂාව | 50 | විනාඩි 40 | 40% (උදා: ලකුණු 20) |
| ප්‍රශ්න පත්‍රය IV | ඉංග්‍රීසි භාෂාව | 50 | විනාඩි 40 | 30% (උදා: ලකුණු 15) |

මෙම වගුවෙන් දැක්වෙන ආකාරයට අයදුම්කරුවකු ප්‍රවේශ විභාගය සමත්වීමට නම් ඔහුගේ හෝ ඇයගේ සාමාන්‍ය බුද්ධිය සහ සාමාන්‍ය දැනීම යන ප්‍රශ්න පත්‍ර සඳහා ඉහළ ලකුණු ලබාගැනීමට අමතරව සිංහල/දෙමළ භාෂාව ප්‍රශ්න පත්‍රය සඳහා අවම ලකුණු 20 ක් ද, ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රය සඳහා අවම ලකුණු 15 ක් ද ලබාගැනීම අනිවාර්ය වේ. එහි අදහස වන්නේ අයදුම්කරුවකු විසින් ප්‍රශ්න පත්‍රය I - සාමාන්‍ය බුද්ධිය සහ ප්‍රශ්න පත්‍රය II - සාමාන්‍ය දැනීම යන ප්‍රශ්න පත්‍ර වලට ප්‍රවේශ විභාගයේ දී ඉහළ ලකුණු ලබාගත්ත ද ඔහු හෝ ඇය විසින් ඉහත සඳහන් කරන ලද අවම ලකුණු III වන සහ IV වන ප්‍රශ්න පත්‍ර සඳහා ලබා නොගන්නේ නම් ඔහු හෝ ඇය ප්‍රවේශ විභාගය සමත්වීමට සුදුසුකම් නොලබන බව ය.

## 10. ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ශිෂ්‍ය ඇබෑර්තු/ආසන සංඛ්‍යාව

10.1 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ඇති ශිෂ්‍ය පුරප්පාඩු/ඇබෑර්තු සංඛ්‍යාව සහ දින පාසල් පවත්වනු ලබන භාෂා මාධ්‍යය පහත දැක් වේ.

| ප්‍රාදේශීය මධ්‍යස්ථානය | ශිෂ්‍ය අබෑර්තු සංඛ්‍යාව | භාෂා මාධ්‍යය | | |
|---|---|---|---|---|
| | | සිංහල | ඉංග්‍රීසි | දෙමළ |
| කොළඹ | 210 | √ | √ | √ |
| මහනුවර | 110 | √ | √ | √ |
| මාතර | 110 | √ | - | - |
| අනුරාධපුරය | 60 | √ | - | - |
| යාපනය | 60 | - | - | √ |
| මඩකලපුව | 60 | - | - | √ |
| බදුල්ල | 60 | √ | - | √ |
| කුරුණෑගල | 60 | √ | - | - |

10.2 අපේක්ෂකයන් විසින් ප්‍රවේශ පරීක්ෂණයේ දි ලබාගන්නා ලකුණුවල අවරෝහණ අනුපිළිවෙල අනුව පමණක් එම ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ඇති ශිෂ්‍ය පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. කිසිම හේතුවක් මත එවැනි අපේක්ෂකයකු වෙනත් ප්‍රාදේශීය මධ්‍යස්ථානයක ශිෂ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා සලකා නොලබයි.

ඔබ අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වන **භාෂා මාධ්‍ය පවතින**, ඔබගේ **ස්ථිර පදිංචියට** ආසන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානය ඔබගේ අධ්‍යයන මධ්‍යස්ථානය ලෙස ඔබට තෝරා ගත හැකි ය.

10.3 නීතිවේදී උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි වූ සියුන් විසින් තෝරාගත් ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දි පමණක් සියළු අධ්‍යයන ක්‍රියාකාරකම් සහ සිය විභාග සඳහා පෙනී සිටිය යුතු ය. කිසියම් ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් සඳහා ලියාපදිංචි වී ඇති අපේක්ෂකයකු නීතිවේදී උපාධි වැඩසටහන සාර්ථක ලෙස නිම කරන තෙක් එම ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙනස් කිරීම හෝ ඔහු/ඇය ලියාපදිංචි වූ ප්‍රාදේශීය මධ්‍යස්ථානය හැර වෙනත් ප්‍රාදේශීය මධ්‍යස්ථානයක දි කවර හෝ විභාගයකට හෝ පරීක්ෂණයකට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

## 11. අධ්‍යයන සහ ඉගැන්වීමේ මාධ්‍යය

3 වන හා 4 වන මට්ටම්වල දි මුද්‍රිත පාඨමාලා ග්‍රන්ථ භාෂා මාධ්‍යය තුනෙන්ම සපයනු ලැබේ. ශිෂ්‍යයින්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතාවය වර්ධනය කරගැනීමට උපකාරයක් ලෙස 5 වන හා 6 වන මට්ටම්වල දි පාඨමාලා ග්‍රන්ථ ඉංග්‍රීසි

මාධ්‍යයෙන් පමණක් නිකුත් කරනු ලැබේ. මෙම අධ්‍යයන දෙපාර්තමේන්තුව ද්වී භාෂා ප්‍රවීණතාව ප්‍රවර්ධනය කරන බැවින් මව් භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ප්‍රාමාණික දැනීමක් තිබීම ඔබගේ අධ්‍යයන කටයුතු සාර්ථකවීමට පිටිවහලක් වනු ඇත.

## 12. අධ්‍යයන වැඩසටහන ආරම්භ කිරීම

2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා නීතිවේදී උපාධි වැඩසටහන සහ එහි අධ්‍යයන ක්‍රියාකාරකම් වර්ෂ 2017 අගෝස්තු මස ආරම්භ කිරීමට නියමිත ය.

## 13. ගාස්තු

සිසුන් විසින් ගෙවිය යුතු ගාස්තු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | - | රු. | 400.00 |
| පහසුකම් ගාස්තු | - | රු. | 1500.00 |
| පුස්තකාල ගාස්තු | - | රු. | 100.00 |
| එක් සම්මානයක් සඳහා පාඨමාලා ගාස්තු[4] | - | රු. | 950.00 |
| නීති අධ්‍යයනය සඳහා ඉංග්‍රීසි පාඨමාලාව (එක් සම්මානයක් සඳහා) | - | රු. | 4000.00[5] |

- **අපේක්ෂකයකු විසින් ගෙවිය යුතු සමස්ත ගාස්තු ප්‍රමාණය තීරණය වන්නේ අදාල වර්ෂය සඳහා ඔහු/ඇය හැදෑරීමට බලාපොරොත්තු වන සම්මාන ගණන මතය.**

- විදේශ සිසුන් සඳහා දේශීය සිසුන්ගෙන් අය කරන ගාස්තුව මෙන් සිව් ගුණයක් අය කරනු ලැබේ.

- අවශ්‍ය වුවහොත් ඉහත දක්වා ඇති ගාස්තු සමාලෝචනය කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.

## 14. අධ්‍යයන කාර්යයන් සඳහා ඉංග්‍රීසි සහතික පත්‍ර (නීති අධ්‍යයන) වැඩසටහන

14.1 භාෂා අධ්‍යයන අංශය විසින් නීතිවේදී උපාධි අධ්‍යයන වැඩසටහන හදාරන සිසුන් සඳහා ඉංග්‍රීසි පිළිබඳ විශේෂ අධ්‍යයන වැඩසටහනක් පවත්වයි. මෙම අධ්‍යයන වැඩසටහන්, නීතිවේදී උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වී ඇති සියළුම සිසුන්ට අනිවාර්ය වේ.

---

[4] නීතිවේදී උපාධිය සඳහා එක් අධ්‍යයන වර්ෂයකට සම්මාන 36 ක් ඇත.

[5] 14 වන ඡේදය වැඩි විස්තර සඳහා බලන්න.

14.2 නීතිවේදි උපාධි වැඩසටහන සඳහා තෝරා ගත් සියළුම සිසුන් බඳවාගැනීමේ පරීක්ෂණයේ දි ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දක්වන නිපුණතාව මත ශ්‍රේණිගත කරනු ඇත. එම පරීක්ෂණයේ දි දක්වන භාෂා නිපුණතාව මත ඔවුන් ඉංග්‍රීසි පාඨමාලාව හැදෑරීමෙන් නිදහස් කිරීම හෝ අධ්‍යයන වැඩසටහන හැදෑරිය යුතු බව නිර්දේශ කරනු ලබයි.

**නීතිවේදි උපාධිය පිරිනැමීම සඳහා ඉංග්‍රීසි භාෂා වැඩසටහනින් නිදහස් වූ සිසුන් හැර අනෙක් සියළුම සිසුන් ඉංග්‍රීසි භාෂා වැඩසටහන සම්පූර්ණ කර තිබීම අනිවාර්යය බව කරුණාවෙන් සළකන්න.**

## 15. අධ්‍යයන වැඩසටහන සඳහා ගතවන කාලය

නීතිවේදි උපාධි වැඩසටහනට අදාල විෂය නිර්දේශය අනුව එක් එක් මට්ටමේ දි මාස 12 ක කාලයක් අධ්‍යයන කටයුතු කිරීම අවශ්‍ය වේ. එනිසා අසමත් වීමක් හෝ නැවත පෙනී සිටීමකට යටත් නොවී අධ්‍යයන කටයුතු අඛණ්ඩව සිදු කරන ශිෂ්‍යයකුට වර්ෂ 4 ක දි අධ්‍යයන වැඩසටහන නිම කළ හැකි ය. එනම් මෙම අධ්‍යයන වැඩසටහන අධ්‍යයන වර්ෂ හතරක දි නිම කළ හැකි ය. කෙසේ වෙතත් සියලුම උපාධි අපේක්ෂකයන් ඔහුගේ හෝ ඇයගේ පළමු ලියාපදිංචියේ සිට අවුරුදු 12 ක උපරිම කාලසීමාවතට යටත්ව සිය නීති වේදි උපාධිය සම්පූර්ණ කළ යුතුය. (සියලුම සිසුන් ඔහුගේ හෝ ඇයගේ පළමු ලියාපදිංචියේ සිට අවුරුදු 4 ක උපරිම කාලසීමාවතට යටත්ව තෙවන මට්ටමේ සියලු පාඨමාලා සම්පූර්ණ කළ යුතුය)

## 16. නීතිවේදි උපාධි වැඩසටහන සඳහා අනුමත පාඨමාලා

### 16.1 3 වන මට්ටම

3 වන මට්ටමේ දි පහත සඳහන් පාඨමාලා උගන්වනු ලැබේ.

| පාඨමාලා කේතය | පාඨමාලාවේ නම |
|---|---|
| LWU1201 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය I |
| LWU1202 | සාධාරණත්ව නීතියේ මූලධර්ම[6] |
| LWU1411 | ශ්‍රී ලංකාවේ නීතිය පිළිබඳ හැඳින්වීමක් |
| LWU1412 | නීති ක්‍රම |

[6] කෙසේවුවද LWU1202 සාධාරණත්ව නීතියේ මූලධර්ම පාඨමාලාව සම්පූර්ණ නොකර ශිෂ්‍යයකු හට 3 වන මට්ටමින් 4 වන මට්ටමට උසස් විය හැකිය.

## 16.2 4 වන මට්ටම

නීතිවේදී උපාධි පාඨමාලාවේ 3 වන මට්ටමේ සිට 4 වන මට්ටමට උසස් වීම සඳහා ශිෂ්‍යයෙකු විසින් 3 වන මට්ටමේ සියළුම පාඨමාලා ඔහුගේ හෝ ඇයගේ මුල් ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ හතරක් (4) තුළ සාර්ථකව නිමකර තිබිය යුතු ය. ඒවා නම් LWU1411, LWU1412, LWU1201 සහ LWU1202

| **පාඨමාලා කේතය** | **පාඨමාලාවේ නම** |
|---|---|
| LWU2311 | ගිවිසුම් නීතිය |
| LWU2312 | අපරාධ නීතිය |
| LWU2313 | පවුල් නීතිය |
| LWU2314 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය II |

## 16.3 5 වන මට්ටම

4 වන මට්ටමේ සිට 5 වන මට්ටමට උසස් වීම සඳහා තුන් වන මට්ටමේ පාඨමාලාවන් හැදෑරීමෙන් නිදහස් වූ නීතිඥයකු හැර ඕනෑම ශිෂ්‍යයෙකු පහත සඳහන් පාඨමාලාවන් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(අ) 3 වන මට්ටමේ සියළුම පාඨමාලා
(ආ) 4 වන මට්ටමේ සියළුම පාඨමාලා

| **පාඨමාලා කේතය** | **පාඨමාලාවේ නම** |
|---|---|
| LWU3311 | පරිපාලන නීතිය |
| LWU3312 | ඉඩම් නීතිය |
| LWU3314 | පරිසර නීතිය |
| LWU3315 | අන්තර් ජාතික නීතිය |

## 16.4 6 වන මට්ටම

5 වන මට්ටමේ සිට 6 වන මට්ටමට උසස් වීම සඳහා ශිෂ්‍යයෙකු විසින් 3, 4 සහ 5 වන මට්ටමේ සියළු විෂයයන් සම්පූර්ණ කර තිබීම හෝ අවම වශයෙන් 5 වන මට්ටමේ පාඨමාලා හතරම සඳහා යෝග්‍යතාව[7] ලබා තිබිය යුතු ය.

---

[7] යෝග්‍යතාවය යනු සෑම විෂයක් සඳහාම පවත්වනු ලබන අඛණ්ඩ ඇගැයීම්වලින් ලබාගත යුතු අවම ලකුණු සංඛ්‍යාවයි. මෙම යෝග්‍යතාවය (අවම ලකුණු ප්‍රමාණය) නොමැතිව එම විෂය සඳහා පවත්වනු ලබන අවසාන විභාගයට පෙනී සිටිය නොහැක.

| **පාඨමාලා කේතය** | **පාඨමාලාවේ නම** |
| --- | --- |
| LWU4321 | නීති විද්‍යාව[8] |
| LWU4323 | කාර්මික නීතිය |
| LWU4324 | වාණිජ්‍යය නීතිය |
| LWU4325 | අන්තර්ජාතික මානව හිමිකම් නීතිය |
| LWU4326 | දිලික්ත නීතිය |

**වැදගත්**

**2016/2017 අධ්‍යයන වර්ෂය, නීතිවේදී උපාධි අධ්‍යයන වැඩසටහන සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා වන අයදුම්පත් අන්තර්ජාලයෙන්** (online) **ලබා ගතයුතුය. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් අයදුම්කරු අධ්‍යයන කටයුතු හැදෑරීමට අපේක්ෂා කරන ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙත අන්තර්ජාලය මගින්** (online) **2017 පෙබරවාරි 11 වන දින හෝ එදිනට පෙර ලැබීමට සලස්වන්න.**

[8] LWU 4321- නීති විද්‍යාව සහ LWU 4326- දිලික්ත නීතිය ප්‍රධාන/අනිවාර්යය පාඨමාලා වේ. ඉතිරි වෛකල්පිත විෂයයන් තුනෙන් ඕනෑම දෙකක් සිසුන්ට තෝරා ගත හැකි ය.

| | |
|---|---|
| ***කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය***<br><br>යූ.එච්.බී.පී. අංගම්මන මිය<br>සහකාර අධ්‍යක්ෂක<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>නාවල<br>නුගේගොඩ<br><br>දු.ක. 011-2853930/281/360/380 | ***මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය***<br><br>අනුෂ්ක බණ්ඩාර මයා<br>සහකාර අධ්‍යක්ෂක<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>පොල්ගොල්ල<br>මහනුවර<br><br>දු.ක. 081-2494083/084/495 |
| ***මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය***<br><br>ජී. දිනේෂ් මයා<br>සහකාර අධ්‍යක්ෂක<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>නූපේ<br>මාතර<br><br>දු.ක. 041-2222943/782 | ***අනුරාධපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානය***<br><br>ශ්‍යාමා මධුගල්ල මිය<br>සහකාර අධ්‍යක්ෂක<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>ජයන්ති මාවත<br>අනුරාධපුරය<br><br>දු.ක. 025-2222871 |
| ***යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය***<br><br>කේ. කන්තවේල් මයා<br>සහකාර අධ්‍යක්ෂක<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>බ්‍රවුන්ස් මාවත<br>කොකාවිල්<br>යාපනය<br><br>දු.ක. 021-2223374 | ***මඩකලපුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය***<br><br>ඒ.ඕ. කමලනාදන් මයා<br>සහකාර අධ්‍යක්ෂක<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>අංක 23<br>නව මාවත<br>මඩකලපුව<br><br>දු.ක. 065-2222264 |
| ***බදුල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය***<br><br>හිරන්ති ගලහිටියාව මිය<br>සහකාර අධ්‍යක්ෂක<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>අංක 179<br>කැප්පෙටිටිපොළ මාවත<br>බදුල්ල<br><br>දු.ක. 055-3012151/2228842 | ***කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය***<br><br>මහින්ද සකලසූරිය මයා<br>සහකාර අධ්‍යක්ෂක<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>මීගමුව පාර<br>නිස්සංක මාවත<br>මල්කඩුවාව<br>කුරුණෑගල<br>දු.ක. 037-2223473 |

***සැ.යු.***

ඔබගේ ජාතික අනන්‍යතා පත්‍රය හෝ ඔබගේ අනන්‍යතාව තහවුරු කළ හැකි ලේඛනයක් **අයදුම් පත්‍රය සමඟ නිකුත් කළ විභාග ප්‍රවේශ පත්‍රය සමඟ** ප්‍රවේශ විභාගය භාරව සිටින අධීක්ෂකවරයාට සහ ශාලා පරීක්ෂක කාර්ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය. තවද විභාග ප්‍රවේශ පත්‍රයෙහි ඔබගේ අත්සන එහි දක්වා ඇති ඕනෑම පුද්ගලයෙකු මගින් සහතික කරවා ගත යුතු ය.